6 මට හැඟෙන අයුරින් රසිකොලොජිය
rasikalogy.blogspot.com

# රටගිය ඇත්තන් ගේ නිහඬ සේවය

**වෙනත් රටවල ජීවත්වීම සඳහා ලංකාවෙන් සංක්‍රමණය කරන ඔබ මා වැනි අයගෙන් ලංකාවට ඇති ප්‍රයෝජනය කුමක්දැයි අවඥාවෙන් විමසන අය ලංකාවේ සිටිති. ඔවුන්ට දිය හැකි පිළිතුරු බොහෝ ය. ඒ පිළිතුරු අතරට සාමාන්‍යයෙන් එක් නොවන කරුණක් ගැන ලිවීමට මගේ තරමක් වෙනස් අත්දැකීමක් උපයෝගී කර ගැනීමට සිත්විය. මා තරුණ වියේ දී රැකියා වෙළඳ පොළට පිවිස නිරතවුණු තුන්වන රැකියාව වූයේ රජයේ සංස්ථාවක සහකාර මැවිසුරු (ඉංජිනේරු) තනතුරකි. මේ රැකියාව සඳහා එකම සුදුසුකම වූයේ ඉංජිනේරු උපාධියක් පමණක් වුවත්, මා සමග සේවය ඇරඹූ විදුලි ඉංජිනේරුවන් සහ කාර්මික ඉංජිනේරුවන් එකොළොස් දෙනෙකුගේ කණ්ඩායමට මට වඩා වසර කිහිපයක පළපුරුද්ද ඇති අය ද, (වඩා හොඳ ස්ථිර රැකියාවක්, පිටිසර සිට කොළඹ අවට රැකියාවක් යනාදී) විවිධ හේතු මත අයැදුම් කර, සම්මුඛ පරීක්ෂණ ක්‍රමවේදයෙන් තේරී පත්වී තිබුණි. මගේ පශ්චාත් විශ්වවිද්‍යාල සේවා පළපුරුද්ද ද මේ වන විට වසරක පමණ විය.**

අප ආයතනයට මේ ආකාරයට ඉංජිනේරුවන් බඳවාගෙන තිබුණේ වසර අටකට පසුව ය.

ඉංජිනේරු සේවයේ අපට වඩා පහත ශ්‍රේණියේ තනතුර වූයේ ඉංජිනේරු සහකාර තනතුරයි. ඒ සඳහා අවශ්‍ය සුදුසුකම වී තිබුණේ ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාවයි. ඉංජිනේරු සහකාරයෙකුට, එම තනතුරේ වසර නමයක් වැනි පළපුරුද්දක් ලද විට හෝ එසේ නොමැතිනම් ඊට පෙර ඉංජිනේරු ආයතනයක විභාග සමත්ව එහි සාමාජිකත්වය ලබාගත් විට සහ ආයතනයේ සහකාර ඉංජිනේරු තනතුරක පුරප්පාඩුවක් ඇත්නම් සහ ඒ සඳහා අභ්‍යන්තරව ඉල්ලුම්පත් කැඳවූවොත් අයැදුම් කළ හැකි විය. මේ ආයතනයේ සේවයට එක් වී මද කලකින් මා හඳුනාගත් සමන් ඒ ආකාරයෙන් සේවයට බැඳී ඉංජිනේරු ආයතනයේ විභාග සම්පූර්ණ කර සාමාජිකත්වය ලබා සහකාර ඉංජිනේරුවෙකු ලෙස උසස්වීමක් ලැබ සිටි අයෙකි.

අප ආයතනයේ ඉංජිනේරු සේවයේ අපට වඩා ඉහළ තනතුර වූ ඉංජිනේරු ධුරය සඳහා උපාධියෙන් පසු සිව් වසරක පළපුරුද්ද හෝ පශ්චාත් උපාධියක් හෝ වරලත් ඉංජිනේරු සුදුසුකම අවශ්‍ය විය. ඊටත් ඉහළ තනතුර වූයේ එක් එක් අංශවල කළමනාකාර තනතුරයි. ඒ සඳහා ඉංජිනේරුවෙකු ලෙස වසර නමයක



පළපුරුද්දක් අවශ්‍ය විය.

මේ ඉහළ තනතුරු දෙවර්ගය ම සඳහා අලුතින් බඳවා ගැනීමක් මා දන්නා පරිදි නොකෙරුණු අතර, පුරප්පාඩු පුරවනු ලැබුවේ අභ්‍යන්තර උසස්වීම් මගිනි. සේවය අරඹා සති කිහිපයක "ඉන්ඩක්ෂන්" කාලයකින් අනතුරුව, මා අනුයුක්ත වූයේ ආයතනයේ යාන්ත්‍රික ඉංජිනේරු සහ දත්ත සැකසුම් දෙපාර්තමේන්තුවටයි. මා මේ තනතුරේ වසර තුනයි මාස නමයක් සේවය කළෙමි. මේ කාලය ඇතුළත මාස විස්සක අධ්‍යයන නිවාඩුවක් ද ලබා ගත්තෙමි. ඒ නිවාඩුවෙන් පසු මා නැවත සේවය අරඹා, මාස කිහිපයක් ගත වූ පසු පාලනාධිකාරිය විසින් අපේ දෙපාර්තමේන්තුව ව්‍යුහමය වෙනසකට ලක් කරන ලදී. තවත් මාස කිහිපයකට පසු, පුරප්පාඩුව තිබූ මට ඉහළ ඉංජිනේරු තනතුර සඳහා අයැදුම්පත් කැඳවා, ඒ සඳහා පැවැත්වුණු සම්මුඛ පරීක්ෂණයකින් පසුව මට තරමක පඩි වැඩිවීමක් ද සහිතව උසස්වීමක් ලැබුණි. අවාසනාවකට මෙන්, මා මේ ඉහළ තනතුරේ සේවය කළේ මාසයක් පමණි. ඒ, මා ඊට කලින් මුහුණ දී තිබුණු සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵලය අනුව ටික දිනකින්ම මට විශ්වවිද්‍යාලයක රැකියාවක් ලැබුණු නිසාය. ඒ අළුත් රැකියා ස්ථානයේ, අළුත් රැකියාවේ, මාසයක් දෙකක් සේවය කළ පසු, මට පරණ සේවා ස්ථානයට යාමට අවස්ථාවක් ලැබුණි.

අදාළ කටයුතු නිමවා, මගේ මිතුරන් කීප දෙනෙකු ද මුණ ගැසී කතාබහක නිරත වී, ඉන් පසු මා ගියේ ආයතනයේ මා සේවය කළ දෙපාර්තමේන්තුවටයි.

එහිදී මට මා හිතවත් දත්ත සකසන්නන් කීප දෙනා ද, පරිගණක ඉංජිනේරුවන් දෙදෙනා ද මුණ ගැසුණි. ඊට අමතරව වෙනත් දෙපාර්තමේන්තුවකට අනුයුක්ත සහකාර ඉංජිනේරුවෙක් වූ මා පෙර සඳහන් කළ සමන් ද එහි රැඳී සිටියේ ය.

අපේ දෙපාර්තමේන්තුවේ දත්ත සැකසුම් සේවා ගැන විවිධ වැඩ කටයුතු සඳහා අන් අය එහි පැමිණීම සාමාන්‍යයෙන් සිදුවේ. ඒ බොහෝ විට, ගණකාධිකාරී අංශයේ අයයි. නමුත් ඔහු එහි වාඩිවී සිටි ආකාරය අනුවත්, මගෙන් විමසූ ප්‍රශ්නයකට අනුවත්, සමන් එවැනි කාර්යයකට එහි පැමිණ සිටි බවක් නොපෙනුණි.

ස්වල්ප වේලාවකින් මට සියල්ල වැටහුණි. මගේ ඉල්ලා අස්වීම නිසා පුරප්පාඩු වූ ඉංජිනේරු තනතුරට උසස්වීමක් ලබා ඇත්තේ සමන් ය.

මා ආයතනයේ සේවයෙන් අස් නොවුනේ නම්, සමන්ට මේ උසස්වීම ලැබෙන්නට ඉඩක් නොතිබුණු බව අමුතුවෙන් කිව යුතු නොවේ.

ඔහු ඒ උසස්වීම ලබා තිබුණේ ඔහු ගේ සුදුසුකම් හා පළපුරුද්ද මත බව සත්‍යයක් නමුත්, රැකියාවෙන් ඉල්ලා අස්වීම තුළින් ඒ පුරප්පාඩුව නිර්මාණය කර, මා නොදැනම, මා සමන්ට කර තිබුණේ එක්තරා ආකාරයකට උදව්වකි!

එය වැටහුණු පසු මට ඇති වූයේ දැඩි සතුටක් බව කිව යුතුය.

මා මුලින් කීවාක් සේ මෙය පරණ කතාවකි. මේ කතාවේ අපට අදාල දිගුව නම්, වෙනත් ආයතනයකට මා සේවයට යාම නිසා නිසා සමන්ට උසස්වීමක් ලැබුණා සේ ම, ලංකාවෙන් අප ඕස්ට්‍රේලියාව වැනි රටකට සංක්‍රමණය වීම නිසා ද, එසේ නොකොට ලංකාවේ ජීවත්වෙන්නන්ට ඒ ආකාරයේ ම, වාසි සිදුවුණු බවයි. මේ පිළිබඳ අදහස් දක්වන කැන්බරාවාසී මිතුරෙකු මෙසේ පැවසීය.



"ඒ වගේම අප සේරම අමතක කරන කරුණ නම්, ලංකාවේ ආර්ථික වර්ධන වේගය අනුවත්, ජනඝණත්වය අනුවත්, එහි උපදින සියල්ලන්ටම රැකියා, රට ඇතුලෙම උත්පාදනය සිතුවිල්ලක් විතරයි යන්න ය". එනිසා, ලංකාවේ විරැකියාව අවම කිරීමට අප ද දායක වී ඇත. විදෙස් රටවල ස්ථිර පදිංචිය ඇති සහ රැකියා කරන සියළු දෙනා, වහාම ලංකාවට ආපසු ගියහොත් ලංකාවේ විරැකියාව දරුණු තත්වයට ඉහල යනු ඇත.

**දැන් ඉතිං, සංක්‍රමණය කිරීම ගැන සතුටුවීමට අපට තව එක් කරුණක් තිබේ!**

## රසිකොලොජිස්ට්

